# ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය

ලෝකය පුරාම සියලුම රටවල ස්වකීය දේශයන්ට අනන්‍යය වූ සංස්කෘතික අංගයන් මෙන්ම ස්වදේශීය වූ වෛද්‍ය ක්‍රමද තිබේ. අප රටේ ද පාරම්පරිකව උරුමයක් ලෙස ආ දේශීය වෛද්‍ය ක්‍රමය ඈත අතීතයේ සිට අපේ මුතුන් මිත්තන් දිවි හිමියෙන් ආරක්ෂා කර ගත්හ. උතුරු ඉන්දීය ආයුර්වේදයත්, දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය ක්‍රමයත්, අරාබි දේශයේ යුනානි වෛද්‍ය ක්‍රමයත් සම්මිශ්‍රණය වී අද දේශිය වෙදකම සිරිලක පුරා විසිරිව පවතී. වර්ථමානයේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හා පාරම්පරිකව උරුමයක් ලෙස ආ දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රධානව ශ්‍රී ලංකාවේ ජනයාට රජයේ ආයුර්වේද වෛද්‍ය සේවාව ලෙස මෙම වෛද්‍ය ක්‍රම වලින් නොමිලේ සුවසෙත සලසයි.සිද්ධාන්තමය කරුණු වශයෙන් සැලකූ විට ආයුර්වේද වෛද්‍ය ක්‍රමය වඩා පොහොසත් වේ.

ආයුර්වේදය යනු ආයුෂ යන්නෙන් දීර්ඝ ජීවිතය ද වේදය යන්නෙන් උසස් දැනගැනීම නොහොත් උතුම් අනුශාසනය ද ගැනේ . මේ අනුව දිගු කලක් ජීවත්වීමට උපදෙස් දෙන උතුම් ශාස්ත්‍රය 'ආයුර්වේදය ලෙසින් නම් කර ඇත.

අද දින එය ඉන්දියාව නේපාලය සහ ශ්‍රී ලංකාවේ මිලියන ගණනක් වූ ජනතාව විසින් බහුලව භාවිතා කරන ක්‍රමයකි. බටහිර රටවල ද ආයුර්වේදය ජනප්‍රියව පවතී.

★ **ආයුර්වේද ජීවන දර්ශනය අනුව රෝග ඇති වූ විට සුව කරනවාට වඩා රෝග වළක්වා ගැනීම වැදගත්ය.**

**ආයුර්වේදය යනු.....**

- ආයුෂය පිළිබඳ විද්‍යාවකි.
- වෛද්‍ය ක්‍රමයක් පමණක් නොව ජීවත් විය යුතු ආකාරය පෙන්වා දෙන ජීවන දර්ශනයකි.

ආයුර්වේදයේ අරමුණු

- ★ නිරෝගී පුද්ගලයාගේ නිරෝගී බව ආරක්ෂා කිරීම
- ★ රෝගී පුද්ගලයාගේ රෝග සුව කිරීම

ආයුර්වේදය අංග අටකින් සමන්විත වේ.

- ශල්‍ය තන්ත්‍රය
- රසායන තන්ත්‍රය
- ශාලාක්‍ය තන්ත්‍රය
- වාජීකරණ තන්ත්‍රය
- කාය චිකිත්සා තන්ත්‍රය
- අගද තන්ත්‍රය
- කෞමාරභෘත්‍ය තන්ත්‍රය
- භූත විද්‍යා තන්ත්‍රය

***ශල්‍ය තන්ත්‍රයඃ-*** ඖෂධ වලින් සුවකළ නොහැකි රෝග වලට ශල්‍ය ප්‍රතිකාර විධි (Operation) භාවිතය හා සම්බන්ධ කොටසයි

***ශාලක්‍ය තන්ත්‍රයඃ-***අක්ෂකාස්ථියෙන් ඉහළ රෝග වලට (ශලාකා කූරු ආධාර කරගෙන) ප්‍රතිකාර කිරීම.

***කාය චිකිත්සා තන්ත්‍රයඃ-***සාමාන්‍ය රෝග වලට (සර්වාංග රෝග) ප්‍රතිකාර කිරීම්

***කෞමාරභෘත්‍ය තන්ත්‍රයඃ-***ස්ත්‍රී රෝග චිකිත්සාව, ගර්භණී චිකිත්සාව හා බාල රෝග චිකිත්සාව මෙහිදී සිදුකරයි. කාන්තාවගේ නිරෝගී බව, නිරෝගී දරුවෙකු ලබාගැනීම හා දරුවාගේ රෝග වලට ප්‍රතිකාර කිරීම ඉලක්ක කෙරේ.

***රසායන තන්ත්‍රයඃ-*** තරුණ බව රැකගැනීම එනම් රූපලාවන්‍ය ප්‍රතිකාර ඇති කොටසයි. ශරීරය පුෂ්ටිමත් කරන ක්‍රමද මෙහි අන්තර්ගත වේ.

***<u>වාජීකරණ තන්ත්‍රයඃ-</u>*** ලිංගික ශක්තිය වැඩි කරන ක්‍රම අන්තර්ගත වේ. ප්‍රජාව පවත්වාගෙන යාම පිළිබඳව ඉලක්ක කෙරේ.

***<u>අගධ තන්ත්‍රයඃ-</u>*** විෂ පිළිබඳව ඇති කොටස වේ. සර්ප විෂ හා නොයෙක් පාෂාණ වර්ගද ශාක ද්‍රව්‍යවල විෂද තවද කෘත්‍රිම විෂ වර්ග වලින් ඇතිවන තත්ත්වයන්ටද ප්‍රතිකාර කරයි

***<u>භූතවිද්‍යා තන්ත්‍රයඃ-</u>*** භෞතික නොවන හේතු සහිත කාරණා නිසා හටගත් රෝග සඳහා නොයෙකුත් යාග-හෝම, බලි-තොවිල් ආදිය මගින් කරන ප්‍රතිකාර විධි මෙයට අදාළ වේ.

එනම් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ස්වභාවය පුළුල් පරාසයක විහිදෙන බවයි.

## <u>නිරෝගී ජීවිතයකට ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමයෙන් ඔබට දැනුම...</u>

### පුද්ගල නීරෝගී බව ආරක්ෂා කිරීම සඳහා වන සෞඛ්‍ය සංරක්ෂණ විධි

*★ චර්යා ධර්ම ★ සද්වෘත්ත ★ ආචාර රසායනය*

***<u>චර්යා ධර්ම</u>***

- දින චර්යා
- ගර්භිණී චර්යා
- ධර්ම චර්යා
- ඍතු චර්යා
- සූතිකා චර්යා
- බ්‍රහ්ම චර්යා

### පුද්ගල නීරෝගී බව ආරක්ෂා කිරීම සඳහා වන දින චර්යා

- ☛ උදෑසන අවදිවීම
- ☛ ව්‍යායාමය
- ☛ නින්ද
- ☛ උෂ්ණ පානය
- ☛ තෛල අභ්‍යංගය

☛ මල මුත්‍ර බැහැර කිරීම ☛ ජල ස්නානය

☛ දත් සහ දිව මැද පිරිසිදු කිරීම ☛ ආහාර ගැනීම

## උදෑසන අවදිවීම

බ්‍රහ්ම මුහුර්තය ශ්‍රේෂ්ඨතම වේලාව යි. හිරු උදාවට විනාඩි 48 කට පෙර ඇති විනාඩි 48 ක කාලයයි. වර්තමාන ඔර්ලෝසු වේලාවෙන් පෙරවරු 4.54 සිට 5.42 දක්වාය

## උෂ්ණ පානය

මඳ උණුසුම් ජල පානය

- 250 ml සිට 750ml අතර ප්‍රමාණයක් පානය කල යුතුය

ආහාර මාර්ග පද්ධතිය උත්තේජනය වී මල පහ කිරීම පහසු වේ.

## මල මුත්‍ර බැහැර කිරීම

ශාරීරිකව පිරිසිදු වීමයි.

## දත් සහ දිව මැද පිරිසිදු කිරීම

- මුඛයේ දුගඳ බව ඉවත් වී ප්‍රසන්න බවක් ඇති වීම.
- අනවශ්‍ය සෙම් කොටස් ඉවත් වීම.
- ආහාර රුචිය ඇති වීම.
- සිතේ ප්‍රසන්න බවක් ඇති වීම.

## ව්‍යායාමය

- වයස ශරීර බලය ශක්තිය කාලය දේශයේ ස්වභාවය යන මේවාට ගැළපෙන ආකාරයට ව්‍යායාම කල යුතුය.

- ඇතැම් රෝග වලින් පෙලෙන අයට මහඟු සහ ඉතා දුබල අයට ව්‍යායාම නුසුදුසු ය.

*ව්‍යායාමයේ ප්‍රයෝජන*

- ★ සිරුර ශක්තිමත් කරයි.
- ★ ශරීර පුෂ්ටිය බලය හා කාන්තිය වර්ධනය වේ.
- ★ ශරීරය මැනවින් හැඩ ගැන්වේ.
- ★ මල කොටස් බැහැර වීම ක්‍රමවත් වීම.

- ★ ජීරණ ශක්තිය දියුණු වී කුසගින්න දැල්වේ.
- ★ සිරුර දැඩි බව සහ සැහැල්ලු බව.
- ★ ඔරොත්තු දීමේ ශක්තිය දියුණු වේ.
- ★ වෙහෙස, ගිලන් බව, පිපාස ශීත, උෂ්ණ ආදිය දැරිය හැකි වීම.
- ★ අලස බව දුරු වේ.
- ★ මානසික සුවය හා සුවදායී නින්ද ඇති වේ.
- ★ පියකරු පෙනුමක් ඇති වේ.
- ★ ආරෝග්‍ය

**තෛල අභ්‍යංගය**

- ශීර්ෂ අභ්‍යංගය- හිසට
- ශරීර අභ්‍යංගය- ඇඟට

*තෛල අභ්‍යංග ප්‍රයෝජන*

- හිසකෙස් ශක්තිමත්වී වර්ධනය වීම කලු පාට වීම.
- මොලය ස්නායු පද්ධතිය පංචේන්ද්‍රියන් නීරෝගී වේ.
- ශිරෝ රෝග දුරු වේ.
- ඇස් පෙනීම වර්ධනය වේ.
- ඉන්ද්‍රිය සන්තර්පනය වේ.
- මුහුණ පැහැපත් වේ.
- සුව නින්දක් ලැබීම.
- ශරීරය මෘදු වේ.
- සම ශක්තිමත් කර පැහැපත් බව ඇති කරයි.
- ශරීරය හා මස්පිඩු ශක්තිමත් කරයි.
- ස්පර්ශ ශක්තිය දියුණු වේ.
- ශරීරය පුෂ්ටිය බලය වර්ධනය වේ.
- නින්ද ශරීර සැපය ගෙන දේ.

**ජල ස්නානය**

උදය වරුවේ ස්නානය සුදුසු බව

සවස් වරුව නුසුදුසු බව

සමහර රෝග වලදී ආහාර ගත් විගස ශරීරය උණුසුම් වී ඇති විට වෙහෙසට පත් වූ අවස්ථාවල නුසුදුසු බව

ශාරීරික මානසික ප්‍රබෝධය ඇති වේ.

**ආහාර ගැනීම**

- සුදුසු කාලයේදී හිතකර වුත් ප්‍රමාණවත් වූ ආහාරය ගත යුතුය.
- තුලිත ආහාරයක් විය යුතුය.
- සප්ත ධාතු වර්ධනය සිදු වේ.

ආහාර ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ආහාර මාත්‍රාව පිළිබඳ සැලකිලිමත් වන්න.
- හීන මාත්‍රාව ශරීරයට අහිතකරයි.
- අධික මාත්‍රාව රෝග ඇති කරයි.
- කුසගිනි නැති විට ආහාර නොගන්න ඇති විට පමණක් ආහාර ගන්න.
- ගත් ආහාරයක් දිරවීමට පෙර නැවත ආහාර නොගන්න.
- නොගැළපෙන ආහාර එකට ගැනීමෙන් වළකින්න.
- අසාත්ම්‍ය ආහාර ගැනීමෙන් වළකින්න.
- හොඳින් නොපැසුණු ආහාර ගැනීමෙන් වළකින්න.
- රෝග තත්ව වලට ගැළපෙන ආහාර පිළිබඳව සැලකිලිමත් වන්න.
- ආහාර ගන්නා විට ශික්ෂණයක් ඇති කර ගන්න.

## නින්ද

- පැය 5 - 6 ලැබීමට සුදුසු බව දක්වයි.
- දිවා නින්ද සුදුසු නැත නමුත් ගර්භණී මවුවරුන්ට මහළු අයට කුඩා දරුවන්ට රෝග වලින් පෙලෙන අයට දිවා නින්ද සුදුසුය.
- රාත්‍රී ආහාරයට පැය 2 කට පසු නිදාගත යුතුය.

## තාම්බුල භක්ෂණය

- ආහාර අනුභවයෙන් පසු සිදු කල යුතුය.
- බුලත්, පුවක්, එනසාල්, කරාබු නැටි, සාදික්කා, අරත්ත මල්, කුංකුමප්පු, සුදුරු, ඉගුරුපියලි, වසාවාසි, කොට්ට පොල්, භාවිතා කල යුතුය.
- මුඛය පිරිසිදු කරයි.
- මුඛ සහ ගල රෝග නසයි.
- ආහාර හොඳින් ජීරණය කරයි.

## පුද්ගල නීරෝගී බව ආරක්ෂා කිරීම සඳහා වන සද්වෘත්ත

සද් + වෘත්ත සද් _ යහපත් වෘත්ත - හැසිරීම

නීරෝගී බව හා සදාචාර බව යන කොටස් දෙක එක විට සම්බන්ධ වන හැසිරීම

☛කායික සද් වෘත්ත ☛ මානසික සද් වෘත්ත ☛සාමාජයීය සද් වෘත්ත ☛ආචාර සද් වෘත්ත ☛ආහාර සද් වෘත්ත ☛ස්වභාවික වේගයන් පිළිබඳ සද් වෘත්ත ☛ස්ත්‍රීන් ඇසුරු කිරීම පිළිබඳ සද් වෘත්ත ☛අධ්‍යාපනය පිළිබඳ සද් වෘත්ත ☛ස්වයං පාලනය පිළිබඳ සද් වෘත්ත

***<u>ස්වභාවික වේගයන් පිළිබඳ සද් වෘත්ත</u>***

**නොදැරිය යුතු වේගය තමාට දැනුනු අවස්ථාවේම බැහැර කරලීම හෝ ඉටුකර ගැනීම කළ යුතුය.**

▲ මළ, මුත්‍ර, වාත, වමන, කිවිසුම්, උද්ගාර, ඈනුම්, බඩගින්න, පිපාස, නින්ද, ශ්‍රමජ,ශ්වාස, ශුක්‍ර

**දැරිය යුතු වේගය**

▲ මෙලොව සෞඛ්‍ය සංරක්ෂණය උදෙසාද පරලොව සුගතිය සඳහාද දරා ගත යුතු වේ. එනම්, ලෝභ, ශෝක, භය, ක්‍රෝධ, මාන, නිර්ලජ්ජාව, ඊර්ෂ්‍යාව, රාග

# ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය_අප යා යුත්තේ කොතනකටද

## හැඳින්වීම

ලෝකයේ විවිධ වෛද්‍ය ක්‍රම පවතී. එම රටවල පවතින ස්වදේශීය වෛද්‍ය ක්‍රම රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට එකතු කර ගතයුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද අදහසයි. නමුත් මෙහිදී නිසි ප්‍රමිතිය පවත්වා ගත යුතු බව පිලිබඳව තර්කයක් නොමැත.

ශ්‍රී ලංකාවේද නීත්‍යායානුකූලව පිලිගත් වෛද්‍ය ක්ෂේත්‍ර 03 ක් හා ඒ එක් එක් වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් වෛද්‍යවරුන්ද වේ. එනම්,

i. බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය
ii. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය
iii. හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රය

ඒ එක් එක් වෛද්‍ය ක්ෂේත්‍ර වලට අදාලව වෛද්‍ය සභා 03ක් පවතින අතර එම වෛද්‍යවරුන් අදාල වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටිය යුතුයි. (මෙහිදී සිද්ධ, යුනානි හා පාරම්පරික වෛද්‍යවරුන්ද ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වේ )

අප රටේ බටහිර වෛද්‍ය ක්ෂේත්‍ර සඳහා බොහෝ පහසුකම් සැපයේ, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ එතරම් ප්‍රචලිත වී නොමැත. මෙම ලිපියෙන් අවධානය යොමු කරන්නේ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳවයි.

## ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ස්වභාවය

මහා වංශයේ සඳහන් පරිදි විජය කුමරු ශ්‍රී ලංකාවට පැමිණෙන විට කුවේනි රැජිණ කපු කඩමින් සිටියාය. විජය කුමරු එසේ පැමිණෙන විට ඉංදියාවේ සිට 700ක් පමණ වෛද්‍යවරු පිරිසක් පැමිණ ඇත. මේ අනුව ඉංදියාවේ රිෂිවරුන්ගෙන් පැවත එන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ලංකාවට ලැබී ඇත. මෙලෙස ආරාබියන් සමඟ පැවති වෙළෙඳ සබඳතා අනුව යුනානි වෛද්‍ය ක්‍රමයත්, දකුණු ඉංදියාවෙන් සිද්ධ වෛද්‍ය ක්‍රමයත්, උතුරු ඉංදියාවෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත්ලංකාවට ලැබී ඇත.

ලංකාවේ එවකට තිබූ පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය සමග මෙම වෛද්‍ය ක්‍රම, විශේෂයෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මේ වන විට යම් මිශ්‍රවීමක් සිදුව ඇත.

## වෛද්‍යවරයාගේ ස්වභාවය

වෛද්‍යවරු BAMS ( Bachelor of Ayurvedic Medicine and Surgery ) උපාධි පාඨමාලාව හැදෑරූ වෛද්‍යවරු වෙති. මෙම පාඨමාලාව

i. කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යායතනයේ

ii. කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යායතනයේත් පැවැත්වේ.

බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල හා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල වෛද්‍ය සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දේ. මීට අමතරව, BUMS (Bachelor of Unani Medicine and Surgery/ යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය) හා BSMS (Bachelor of Sidda Medicine and Surgery/ සිද්O වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය) යk පාඨමාලාද වේ.

BUMS කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේත්, BSMS යාපනය හා නැගෙනහිර විශ්ව විද්‍යාල වල සිද්ධ දෙපාර්තමේන්තු වල mejeත් වේ.

යාපනයේ කයිතඩි ශික්ෂණ රෝහල මෙම සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දේ.

## BAMS උපාධි පාඨමාලාවේ ස්වභාවය

### i. බඳවා ගැනීමේ පටිපාටිය

අනිකුත් විශ්ව විද්‍යාල වල මූලික උපාධි පාඨමාලාවලට සිසුන් බඳවා ගන්නා ලෙසම වේ.

BAMS උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් එනම්, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් හදාරා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් ඒ ඒ වර්ෂ වල උසස් පෙළ විභාගයට අදාලව දිස්ත්‍රික් පදනම මත ප්‍රකාශයට පත් කරන Z ලකුණු අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබිය යුතුයි.

### ii. පාඨමාලාවේ අන්තර්ගතය

ඉතාම දළ වශයෙන් හා මූලික වශයෙන් ආයුර්වේද මූල ධර්ම රෝග නිර්ණය හා චිකිස්සා ක්‍රම සමග බටහිර වෛද්‍ය ක්‍රමයේ මූලධර්ම ප්‍රතිකාර අධ්‍යයනය, දේශීය (පාරම්පරික) චිකිස්සා ක්‍රම, මළ ශරීර විච්ඡේදනය (කාය විච්ඡේදනය /Human Anatomy) ප්‍රායෝගිකව සිදු කිරීමෙන් හා විද්‍යාගාර පරීක්ෂණ ප්‍රායෝගිකව සිදු කිරීමෙන් හා නීති වෛද්‍ය විද්‍යාව (අධිකරණ වෛද්‍ය විද්‍යාව) ආදී විෂයන් හදාරමින් පැරණි වෛද්‍ය විද්‍යා දැනුම නවීන වෛද්‍ය විද්‍යා දැනුම හා වෛද්‍ය තාක්ෂණික ඥානය මුසුකොට නවීන සමාජයට ලබා දීමට අදාලව සැකසුනු විෂය කරුණු අඩංගුය.

ඊට අමතරව පැරණි දැනුම ලබා ගැනීමට සංස්කෘත භාෂාව ජෝතිෂ්‍ය මූලධර්මද අන්තර්ගත වේ.

නවීන ලෝකය හා සම්බන්ධවීමට පරිගණක දැනුම, ඉංග්‍රීසි භාෂාව මෙන්ම පර්යේෂණ ක්‍රමවේදය ද අන්තර්ගත මෙම උපාධි පාඨමාලාව අධ්‍යයන වර්ෂ පහකින් (5) හා සීමාවාසික පුහුණුව අවුරුද්දක් ලෙස සම්පූර්ණයෙන් වර්ෂ 6 (හය) කි.

## ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අදාල වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා වැටුප් පරිමාණ

කැළණිය හා කොළඹ විශ්ව විද්‍යාල වලින් පිටවන BAMS උපාධිධාරි වෛද්‍යවරු (වසරකට 200ක් පමණ ) කුසලතා අනුපිලිවෙලට රාජ්‍ය සේවයට බඳවා ගනී.

**තනතුර**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර සණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි **තනතුර**

**මූලික වැටුප**

රු.54,290.00 කි ( 3/2016 වැටුප් චක්‍රලේඛය අනුව වර්ෂ 2020 දී)

**පත්වීම් බලධාරියා**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

★ අනාගතයේදී මෙවන් වැදගත් තොරතුරු, රෝග හා රෝග වළක්වගන්නා ආකාරය, ඖෂධ පැළ ආදිය පිළිබදවත් අපගේ පහත වෙබ් අඩවියෙන් ලබාගත හැක.

***පසර නීරෝගා*** www.pasaraniroga.com

***දැක්ම***

ජනතාවගේ නීරෝගී බව ආරක්ෂා කිරීමට හා රෝග සඳහා ප්‍රතිකාර ගැනීමට කාර්යක්ෂම වෛද්‍ය ක්‍රමයක් ලෙස ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමය සමාජයේ ප්‍රචලිත කිරීම.

***මෙහෙවර***

ආයුර්වේද හා දේශීය වෛද්‍ය සංකල්ප මත පදනම් වෙමින්, නවීන වෛද්‍ය විද්‍යාත්මක දැනුම හා වෛද්‍ය තාක්ෂණික ඥානය උචිත පරිදි සම්මිශ්‍රණය කරගනිමින්, මිත්‍යාමත හා ව්‍යාජ වෛද්‍යවරුන්ගෙන් ජනතාව ආරක්ෂාකර ගැනීමට ඉවහල්වන දැනුම සමාජගත කරමින්, නවීන සමාජයට වඩාත් යෝග්‍ය ලෙස ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමය රෝග නිවාරණ හා ප්‍රතිකාර සඳහා කාර්යක්ෂම වෛද්‍ය ක්‍රමයක් ලෙස භාවිතා කිරීම හා ඒ සඳහා මඟ පෙන්වීම.

වෛද්‍ය කීර්ති රණසිංහ
(BAMS කැළණිය විශ්වවිද්‍යාලය)

Web - www.pasaraniroga.com

Email l- drkeerthi@pasaraniroga.com

Tel – (+94) 071 149 70 58